# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

ආර්.එස්. හෙට්ටිආරච්චි
405/01 පන්සල පාර,
වාදුරුප්ප
අම්බලන්තොට

**<u>අභියාචක</u>**

**එදිරිව**

**අභියාචනා අංකය :**
**RTIC/Appeal/802/2022**

මහාමාර්ග හා මාර්ග
සංවර්ධන අමාත්‍යාංශය
මගනැගුම මහමැදුර
8 වන මහල
ඩෙන්සිල් කොබ්බෑකඩුව
මාවත
කොස්වත්ත
බත්තරමුල්ල

**<u>පොදු අධිකාරිය</u>**

**ඉදිරිපිටදී :**

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
4. ඒ.එම් නහියා - කොමසාරිස්

**පෙනී සිටීම :**

අභියාචක දු:ක අංක 077 2221901 ඔස්සේ සම්බන්ධ වේ.

පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ අතිරේක ලේකම් යූ.එච්.සී ප්‍රියන්ත මයා සමග සහකාර ලේකම් (පාලන) / තොරතුරු නිලධාරි එච්.එම් තරංගා මධුෂානි මිය සම්බන්ධ වේ.

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - 2022.10.31

**විභාග කළ දිනය :** 2022.11.10, 2023.01.19

**තීරණය කළ දිනය :** 2023.01.19

## <u>කොමිෂන් සභාවේ තීරණය</u>

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2022.03.21 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

1. මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම සිට කුරුණෑගල දක්වා කොටස විවෘත කිරීමේ උත්සවය සංවිධානය හා ඒ සඳහා වියදම් දරනු ලැබුවේ කුමන ආයතනයක් මගින්ද?

2. මධ්‍යම අධිවිගී මාර්ගයේ මීරිගම සිට කුරුණෑගල දක්වා කොටස විවෘත කිරීමේ උත්සවය සඳහා කොපමණ මුදලක් වැයකර තිබේද?

3. එම සමස්ථ වියදම සිදුකල කාර්යයන් මොනවද? ඒ ඒ කාර්යයන් සඳහා සිදුකල වියදම් සම්බන්ධයෙන් සවිස්තර තොරතුරු හා බිල්පත් පිටපත් ලබා දෙන්න

4. i - සමස්ත උත්සවය සඳහා මුදල ලබා දුන් ආයතන මොනවාද?
   ii - එසේ වෙනත් ආයතන මුදල ලබා දී තිබේනම් ඒ ඒ ආයතන ලබා දුන් මුදල් ප්‍රමාණයන් කවරේද යන්න සවිස්තර තොරතුරු ලබා දෙන්න

5. මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම සිට කුරුණෑගල දක්වා වන කොටස විවෘත කිරීමේ උත්සවයේ නර්තන කණ්ඩායම් සඳහා කොපමණ මුදලක් ගෙවා තිබේද?

6. වේදිකා හා සැරසිලි සඳහා කොපමණ මුදලක් වැය කර තිබේද?

7. ජනාධිපති, අගමැති ඇතුළු ආරාධිතයන්ට සංග්‍රහ කටයුතු වෙනුවෙන් කොපමණ මුදලක් වැය කර තිබේද?

8. පැමිණි ජනතාවට සංග්‍රහ කටයුතු වෙනුවෙන් කොපමණ මුදලක් වැය කර තිබේද? ඒ මොනවද?

9. මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම සිට කුරුණෑගල දක්වා කොටස විවෘත කිරීමේදී නිරාවරණය කෙරුණු සමරු ඵලකය වෙනුවෙන් කොපමණ මුදලක් වැය කර තිබේද?

10. මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම සිට කුරුණෑගල දක්වා වන කොටස විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් රූපවාහිනි, ගුවන් විදුලි, පුවත්පත් දැන්වීම් සඳහා කොපමණ මුදලක් වැයකර තිබේද යන්න ඒ ඒ මාධ්‍ය අනුව වෙන් වශයෙන් සවිස්තර තොරතුරු ලබා දෙන්න.

11. මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම සිට කුරුණෑගල දක්වා වන කොටස විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් කටවුට්, පෝස්ටර් හා වෙනත් දැන්වීම් හා මාධ්‍ය කටයුතු වෙනුවෙන් කොපමණ මුදලක් වැයකර තිබේද?

12. මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම සිට කුරුණෑගල දක්වා විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් ජනාධිපති, අගමැති ඇතුළු කොපමණ ආරාධිතයන පිරියක් සහභාගී වී සිටියාද?

13. මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම සිට කුරුණෑගල දක්වා කොටස විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් කොපමණ ජනතාවක් සහභාගී කරගනු ලැබුවේද?

14. මධ්‍යම අධිවේගී මාර්ගය විවෘත කරන අවස්ථාවේ කොපමණ වාහන සංඛ්‍යාවක් යොදාගනු ලැබුවේද?

මෙම තොරතුරු ඉල්ලීමට තොරතුරු නිලධාරී 2022.04.20 දිනැතිව පහත ප්‍රතිචාරය දක්වා ඇත.

| ප්‍රශ්න අංකය | තොරතුර |
|---|---|
| *01* | *අමාත්‍යාංශය මගින් මෙම උත්සවය සම්බන්ධීකරණ කරන කටයුතු සඳහා සහභාගී වූ නිලධාරීන් සඳහා පමණක් මුදල් වියදම් කර ඇත.* |
| *02* | *උක්ත සඳහන් කාරණය සඳහා පමණක් මෙම අමාත්‍යාංශය මගින් රු.3090.00ක මුදලක් වැය කර තිබේ.* |
| *03* | *ඉහත අංක 02 හි සඳහන් කාර්යයට දල බිල්පත් ඇමුණුම 01 ඇත.* |
| *04-i* | *අමාත්‍යාංශය සතු ලේඛන වල ඒ සම්බන්ධව සටහනක් නොමැත.* |
| *04-ii* | *ඉහත පරිදි අදාල නොවේ.* |
| *05* | *මෙම අමාත්‍යාංශය විසින් කිසිදු මුදලක් වැයකර නොමැත.* |
| *06* | *මෙම අමාත්‍යාංශය විසින් කිසිදු මුදලක් වැයකර නොමැත.* |
| *07* | *මෙම අමාත්‍යාංශය විසින් කිසිදු මුදලක් වැයකර නොමැත.* |
| *08* | *මෙම අමාත්‍යාංශය විසින් කිසිදු මුදලක් වැයකර නොමැත.* |
| *09* | *මෙම අමාත්‍යාංශය විසින් කිසිදු මුදලක් වැයකර නොමැත.* |
| *10* | *මෙම අමාත්‍යාංශය විසින් කිසිදු මුදලක් වැයකර නොමැත.* |
| *11* | *මෙම අමාත්‍යාංශය විසින් කිසිදු මුදලක් වැයකර නොමැත.* |
| *12* | *සහභාගී වූ ආරාධිතයන්ගේ අත්සන් ලේඛනයක් මෙම අමාත්‍යාංශය සතුව නොමැත.* |
| *13* | *සහභාගී වූ ජනතාවගේ අත්සන් ලේඛනයක් මෙම අමාත්‍යාංශය සතුව නොමැත.* |
| *14* | *මෙම අමාත්‍යාංශය මගින් වාහන 02ක් පමණක් සම්බන්ධීකරණ කටයුතු සඳහා යොදවා ගෙන ඇත.* |

මෙම පිළිතුරෙන් අතෘප්තියට පත් අභියාචක 2022.04.26 වන දින නම් කළ නිලධාරි වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර නම් කළ නිලධාරි විසින් පනතේ දක්වා ඇති නියමිත කාල සීමාවන් තුළ ප්‍රතිචාර දක්වා නොමැත. ඒ අනුව අභියාචක විසින් 2022.05.18 වන දින කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය සිදු කර ඇත.

## සළකා බැලීම

ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමට අදාළව තොරතුරු නිලධාරි විසින් 2022.04.20 වන දින ප්‍රතිචාර දක්වා ඇත. එකී ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක නම් කළ නිලධාරි වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇතත්, නම් කළ නිලධාරි විසින් එකී අභියාචනය විභාග කර තීරණයක් ප්‍රකාශයට පත් කර නැත. ඒ අනුව මෙම කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත. නම් කළ නිලධාරි විසින් අභියාචනය විමර්ශනය නොකර තීරණයක් ලබා නොදීම තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීමකි.

ඉහත සඳහන් තොරතුරු නිලධාරිගේ ප්‍රතිචාරය සළකා බැලීමේදී එය තොරතුරු ඉල්ලීමට අනුගතව සිදු කළ තොරතුරු සැපයීමක් බව නොපෙනේ. ඒ අනුව මෙම කරුණු සළකා බලා ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමට අදාළ සියලුම තොරතුරු 2023.02.15 වන දිනට මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව අභියාචක වෙත ලබා දීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවට තීරණය කරමු.

එසේම, “2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති (ගාස්තු සහ අභියාචනා කාර්ය පටිපාටිය)” රීති මාලාවේ 11 වන රීතිය යටතේ උක්ත තොරතුරු මුදා හැරීමේදී පොදු අධිකාරියට ගාස්තු අය කිරීමේ හැකියාව නොලැබෙන බවද මෙහිලා වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමු.

**කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.**

අභියාචනය අවසන් කරන ලදී.